

# සුපරීක්ෂාකාරී වන්න!

## නිශ්චල දේපළ ගනුදෙනු මුදල් විශුද්ධිකරණයේ නිරතවන්නන්ගේ සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන්ගේ උකුසු ඇසට හසුවීමේ ඉහළ අවදානමක

**ඔබේ නිශ්චල දේපළ ව්‍යාපාරයේ කීර්තිනාමය විනාශ කිරීමට ඔවුන්ට ඉඩ නොදෙන්න.**

## මාගේ නිශ්චල දේපළ ව්‍යාපාරය මෙවැනි පුද්ගලයන්ගෙන් ආරක්ෂා කරගන්නේ කෙසේද?



ඔබගේ ආයතනය සඳහා **අනුකූලතා නිලධාරීවරයෙකු*** පත්කර එම පත්කිරීම අධ්‍යක්ෂ/මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දෙන්න. මූල්‍ය බුද්ධි ඒකකය යනු ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ මූල්‍ය බුද්ධි තොරතුරු ලැබීම, විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීම සඳහා වූ ජාතික ආයතනයයි.

නිශ්චල දේපළ මිලදී ගනු ලබන සහ විකුණනු ලබන විටදී ඔබගේ **ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි අවධානයෙන් යුතුව ක්‍රියා කිරීම**** මගින් ගනුදෙනුකරු සහ / හෝ ප්‍රතිලාභී හිමිකරු හඳුනාගන්නා අතර ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කරගන්න.

යම් නිශ්චල දේපළ වෙළඳාම් ගනුදෙනුවක් මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සමඟ සම්බන්ධ විය හැකි බවට සැක කිරීමට ඔබට සාධාරණ හේතුවක් තිබේ නම්, වහාම ඔබේ එම සැකය මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන්න. එම සැක සහිත ගනුදෙනු වාර්තා කිරීමට "V වන උපලේඛනය"*** භාවිතා කරන්න.
සැක සහිත ගනුදෙනු හඳුනාගැනීම සඳහා ඔබේ සේවකයන් පුහුණු කරලීමට මූල්‍ය බුද්ධි ඒකකය වෙතින් උදව් ලබා දෙනු ඇත.

**ශ්‍රී ලංකාව තුළ මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් හඳුනා ගැනීම, එම තත්වයන් පාලනය කිරීම සහ එකී අවදානම් මඟහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය සමඟ අත්වැල් බැඳ ගන්න.**

* "අනුකූලතා නිලධාරීවරයා පත් කිරීමේ ආකෘති පත්‍රය" හරහා එම පත් කිරීම සිදු කරන්න.

** 2018 අංක 01 දරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ) රීතීන්හි නියම කර ඇති පරිදි ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අදාළ ක්‍රියා පටිපාටීන් අනුගමනය කරන්න.

*** 2017 සැක කටයුතු ගනුදෙනු (ආකෘති) නියෝගවල "V වන උපලේඛනය" භාවිතයෙන් සැක කටයුතු ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන්න.

අනුකූලතා නිලධාරීවරයා ප්‍රකාශයට පත් කිරීමේ ආකෘති පත්‍රය, ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ රීතීන් සහ "V වන උපලේඛනය" www.fiusrilanka.gov.lk හරහා බාගත හැකිය.

අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය,
ශ්‍රී ලංකා මහ බැංකුව,
නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT

0112477125 0112477692 fiudnfbp@cbsl.lk www.fiusrilanka.gov.lk